මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
**Public Service Commission of Central Provincial Council**

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தோட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: *www.psc.cp.gov.lk*
e-mail: *psc.cp.gov@gmail.com*

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2213096 | සහකාර ලේකම්<br>உதவி செயலாளர்<br>Asst. Secretary | 081-5631321 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 081-2213082 |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CPC/PSC/10/SUP/LIMITED - 2025 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2025.09. 19 |

මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
ආයතන ප්‍රධානීන් වෙත,

**මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2025**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කර ඇති 2025.07.11 දිනැති අංක 2,445 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්පත්‍රය මඟින් උක්ත විභාගය සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර එකී නිවේදනය මධ්‍යම පළාතට අදාළ කර ගැනීම සඳහා ආණ්ඩුකාර ලේකම්ගේ අංක ජීසීපී/01/1/1 හා 2025.07.25 දිනැති ලිපියෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත. එමෙන්ම, උක්ත විභාග නිවේදනය ප්‍රසිද්ධ කිරීම සඳහා විභාග කොමසාරිස් ජනරාල්ගේ අංක 5/4/2/9/2025 හා 2025.09.11 දිනැති ලිපියෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ එකඟතාවයද ලැබී ඇත.

02. ඒ අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයට අදාළ අභ්‍යන්තර නිවේදනය www.psc.cp.gov.lk වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කර ඇති අතර, එම අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014.04.07 දිනැතිව අනුමත කරන ලද 2013.04.02 දින සිට ක්‍රියාත්මක මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලටද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලටද යටත්ව, ඔබ ආයතනයේ සේවය කරනු ලබන මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සුදුසුකම් ලත් නිලධාරීන් වෙතොත් මෙකී නිවේදනයේ සඳහන් උපදෙස් පරිදි, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.donets.lk දරන වෙබ් අඩවියෙහි දක්වා ඇති සබැඳිය මඟින් මාර්ගගතව අයදුම්පත් සම්පූර්ණ කිරීමට කටයුතු කරන ලෙසත්, මාර්ගගත ක්‍රමය ඔස්සේ නිවැරදිව සම්පූර්ණ කර බාගත කර ගැනීමෙන් මුද්‍රණය කරන ලද අයදුම්පත, **2025.10.21** දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් මෙම කොමිෂන් සභාව වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

03. පළමු වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් කිසිදු ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් ඉහත සඳහන් විභාගයට පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව රු. 1200/-කි. මෙම විභාග ගාස්තුව ගෙවීම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන පරිදි මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් සිදු කළ යුතු බවට අයදුම්කරුවන් දැනුවත් කරන්නේ නම් මැනවි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ.කේ.ජී.අයි.බී.පී. විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.